# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1645/22 - 2010 මාර්තු 17 වැනි බදාදා - 2010.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන බදුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි ( සංශෝධිත) පනත යටතේ 8 "ඒ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 අප්‍රේල් 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයෙන් යුක්ත වන බදුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 මාර්තු මස 09 වැනි දින,
" සෙත්සිරිපාය ",
බත්තරමුල්ල.

බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, ගරු දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඒ " වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 මාර්තු මස 09 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ප්‍රසන්න සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික සංවර්ධන අධිකාරිය.

2010 මාර්තු මස 17 වැනි දින,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

**මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි ( සංශෝධිත) පනත යටතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 නොවැම්බර් මස 13 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන මාතර නාගරික සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 මාර්තු මස 09 වැනි දින,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

මාතර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මාතර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, ගරු දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඒ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 මාර්තු මස 09 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ප්‍රසන්න සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික සංවර්ධන අධිකාරිය.

2010 මාර්තු මස 17 වැනි දින,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

04-82/2

---

**හික්කඩුව නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි ( සංශෝධිත) පනත යටතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009 සැප්තැම්බර් මස 29 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන හික්කඩුව නාගරික සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 මාර්තු මස 09 වැනි දින,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

හික්කඩුව නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද හික්කඩුව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, ගරු දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඒ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 මාර්තු මස 09 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ප්‍රසන්න සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික සංවර්ධන අධිකාරිය.

2010 මාර්තු මස 17 වැනි දින,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

04-82/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.